ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 1994 අංක 23 දරන
# ආදායම් බදු අධිභාර
# (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1994 දෙසැම්බර් මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1994 දෙසැම්බර් මස 30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1994 අංක 23 දරන ආදායම් බදු අධිභාර (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1994 දෙසැම්බර් මස 27 වන දින]

එල්. ඩී.—ඕ. 75/93

**1989 අංක 7 දරන ආදායම් බදු අධිභාර පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—**

1. මේ පනත 1994 අංක 23 දරන ආදායම් බදු අධිභාර (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1989 අංක 7 දරන ආදායම් බදු අධිභාර පනතේ දීර්ඝ නාමය "පිළිවෙලින් 1989 අප්‍රේල් මස 1 වන දිනයෙන්, 1990 අප්‍රේල් මස 1 වන දිනයෙන්, 1991 අප්‍රේල් මස 1 වන දිනයෙන්, 1992 අප්‍රේල් මස 1 වන දිනයෙන් සහ 1993 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "පිළිවෙලින් 1989 අප්‍රේල් මස 1 වන දිනයෙන්, 1990 අප්‍රේල් මස 1 වන දිනයෙන්, 1991 අප්‍රේල් මස 1 වන දිනයෙන්, 1992 අප්‍රේල් මස 1 වන දිනයෙන්, 1993 අප්‍රේල් මස 1 වන දිනයෙන් සහ 1994 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. **1989 අංක 7 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.**

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ "එහෙත් 1994 මාර්තු මස 31 වන දින පසු නොවී" යන වචන සහ ඉලක්කම් වෙනුවට "එහෙත් 1995 මාර්තු මස 31 වන දින පසු නොවී" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. **ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.**

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— **ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.**

(1) ඒ වගන්තියේ (iv) වන ඡේදයේ "එහි ශේෂය ද ; සහ" යන වචන වෙනුවට "එහි ශේෂය ද" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (v) වන ඡේදයේ "එහි ශේෂය ද ;" යන වචන වෙනුවට "එහි ශේෂය ද, සහ" යන වචන ආදේශ කිරීමෙන් : සහ

(3) ඒ වගන්තියේ (v) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

"(vi) 1994 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය සඳහා ඔහු විසින් ගෙවිය යුතු අධිභාරයේ මුදලින්—

(අ) සියයට පනහකට නොඅඩු ප්‍රමාණයක් 1994 අගෝස්තු මස 15 වන දින හෝ එදිනට පෙර ද ;

(ආ) 1994 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර එහි ශේෂය ද ; ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (ඇ) ඡේදයේ " සියයට 7 1/2 ක් ; සහ " යන වචන හා ඉලක්කම් වෙනුවට " සියයට 7 1/2 ක් ; " යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (ඉ) ඡේදයේ " සියයට 7 1/2 ක් " යන වචන සහ ඉලක්කම් වෙනුවට " සියයට 7 1/2 ක් ; සහ " යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(3) ඒ වගන්තියේ (ඉ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

" (ඊ) 1994 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය සඳහා ඒ සේවා නියුක්තයාගේ පාරිශ්‍රමිකයෙන් ඒ වර්ෂය වෙනුවෙන් අඩු කරනු ලැබිය යුතු සම්පූර්ණ ආදායම් බද්දෙන්—

(i) 1994 ජූලි මාසය සඳහා ඒ සේවා නියුක්තයාට ගෙවිය යුතු පාරිශ්‍රමිකයෙන් සියයට 7 1/2 ක් ; සහ

(ii) 1994 ඔක්තෝබර් මාසය සඳහා ඒ සේවා නියුක්තයාට ගෙවිය යුතු පාරිශ්‍රමිකයෙන් සියයට 7 1/2 ක් ; ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (2) වන උපවගන්තියේ අතුරු වගන්තියේ (ii) වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (ii) මේ පනත යටතේ අදාළ වර්ෂයක් සඳහා අධිභාරය ගෙවීමට යටත් යම් තැනැත්තකු විසින්—

(අ) 1989 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය වෙනුවෙන්, 1988 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා දේශීය ආදායම් පනත යටතේ ඔහු විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන්—

(i) 1989 අගෝස්තු මස 15 වන දින හෝ එදිනට පෙර, සියයට 7 1/2 කට නොඅඩු ප්‍රමාණයක් ; සහ

(ii) 1989 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර සියයට 7 1/2 කට නොඅඩු ප්‍රමාණයක් ;

(ආ) 1990 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය වෙනුවෙන්, 1989 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා දේශීය ආදායම් පනත යටතේ ඔහු විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන්—

(i) 1990 අගෝස්තු මස 15 වන දින හෝ එදිනට පෙර, සියයට 7 1/2 කට නොඅඩු ප්‍රමාණයක් ;

සහ

(ii) 1990 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර, සියයට 7 1/2 කට නොඅඩු ප්‍රමාණයක් ;

(ඇ) 1991 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය වෙනුවෙන්, 1990 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා දේශීය ආදායම් පනත යටතේ ඔහු විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන්—

(i) 1991 අගෝස්තු මස 15 වන දින හෝ එදිනට පෙර, සියයට 7 1/2 කට නොඅඩු ප්‍රමාණයක් ;

සහ

(ii) 1991 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර, සියයට 7 1/2 කට නොඅඩු ප්‍රමාණයක් ;

(ඈ) 1992 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය වෙනුවෙන්, 1991 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා දේශීය ආදායම් පනත යටතේ ඔහු විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන්—

(i) 1992 අගෝස්තු මස 15 වන දින හෝ එදිනට පෙර, සියයට 7 1/2 කට නොඅඩු ප්‍රමාණයක් ;

සහ

(ii) 1992 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර, සියයට 7 1/2 කට නොඅඩු ප්‍රමාණයක්;

(ඉ) 1993 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය වෙනුවෙන්, 1992 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා දේශීය ආදායම් පනත යටතේ ඔහු විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන්—

(i) 1993 අගෝස්තු මස 15 වන දින හෝ එදිනට පෙර, සියයට 7 1/2 කට නොඅඩු ප්‍රමාණයක් ;

සහ

(ii) 1993 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර, සියයට 7 1/2 කට නොඅඩු ප්‍රමාණයක් ;

(ඊ) 1994 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය වෙනුවෙන්, 1993 අප්‍රේල් මස 1 වන දින යෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා දේශීය ආදායම් පනත යටතේ ඔහු විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන්—

(i) 1994 අගෝස්තු මස 15 වන දින හෝ එදිනට පෙර, සියයට 7 1/2 කට නොඅඩු ප්‍රමාණයක්; සහ

(ii) 1994 නොවැම්බර් මස 15 වන දිනට හෝ එදිනට පෙර, සියයට 7 1/2 කට නොඅඩු ප්‍රමාණයක්,

ඒ අධිභාරය වශයෙන් ගෙවනු ලබන අවස්ථාවක—

1989 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය සම්බන්ධයෙන් වන විට, 1990 නොවැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙර;

1990 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය සම්බන්ධයෙන් වන විට, 1991 නොවැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙර;

1991 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය සම්බන්ධයෙන් වන විට, 1992 නොවැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙර;

1992 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය සම්බන්ධයෙන් වන විට, 1993 නොවැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙර;

1993 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය සම්බන්ධයෙන් වන විට, 1994 නොවැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙර; සහ

1994 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය සම්බන්ධයෙන් වන විට, 1995 නොවැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙර

ඔහු විසින් ගෙවන ලද මුදල් ප්‍රමාණයට වැඩියෙන් ඒ අදාළ වර්ෂය සඳහා ඔහු විසින් ගෙවිය යුතු අධිභාරයේ අතිරික්තය ඔහු විසින් ගෙවනු ලබන්නේ නම්, 3 වන වගන්තිය යටතේ හිඟව ඔහුම නියම කරනු ලබන ගෙවීම සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ යම් දණ්ඩනයකට ඒ තැනැත්තා යටත් නොවිය යුතුය.".

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ, "ආදායම් බද්ද" යන් නෙහි අර්ථකථනයේ (i) වන ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(i) වාසික සමාගමක් සම්බන්ධයෙන් වන විට—

(අ) 1993 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් අදාළ වර්ෂයක් සඳහා වූ විට, දේශීය ආදායම් පනතේ 33 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ ඒ අදාළ වර්ෂය සඳහා ඒ සමාගම විසින් ගෙවිය යුතු ආදායම් බද්ද, ඉන් අදහස් වේ ;

(ආ) 1993 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය සඳහා වූ විට, දේශීය ආදායම් පනත යටතේ ඒ අදාළ වර්ෂය සඳහා එම සමාගම විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන් පහත දැක්වෙන මුදල්වල එකතුව අඩු කළ විට ශේෂ වන ආදායම් බද්ද අදහස් වේ:—

(i) එම සමාගම විසින් එම වර්ෂය සඳහා එම පනතේ 33 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ආ) ඡේදය යටතේ ගෙවිය යුතු යම් ආදායම් බද්දක් ; සහ

(ii) එම පනතේ 82 වන වගන්තිය යටතේ හෝ 83 වන වගන්තිය යටතේ ප්‍රදානය කරන ලද යම් සහනයක් සහ 85අ වගන්තිය යටතේ ඉඩදෙන ලද යම් අඩුකිරීමක්.".

**8.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල භාෂා හැන්සාඩ්වල සහ භාෂාවල වාර්ෂික දායක මුදල (පැදිස) රු. 570 කි. (මිලදී ගෙන) රු. 1,160 කි. අංක 255, බෞද්ධාලෝක මාවත, කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත ගෙවා මාර්ගයෙන් දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා සඳහා ලියාපදිංචි
එක් එක් වාර්තා සඳහා ඒ මිල ගණනට ලැබේ.